Set A
1

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය 2018** — **06 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** — **தரம் 06**
**First Term Test 2017** — **Grade 06**

**සිංහල භාෂාව හා සාහිත්‍යය 1**
**Sinhala Language And Literature 1**

**පැය දෙකයි**
*Two Hour*

## I කොටස

*ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01. හිස් තැනට ගැළපෙන අනුක්ත පදය වරහන් තුළින් තෝරාලියන්න.

i. පියාණෝ .............................................. ට (දරුවන් / දරුවෝ) අවවාද දෙති.

ii. බල්ලෝ ................................ (හාවෝ / හාවුන්) පසුපස පැන්නුවෝ ය.

iii. පූසා ............................... (කෘමීහු / කෘමීන්) ආහාරයට ගත්තේ ය.

iv. හෙදිය .................................... (රෝගීහු /රෝගීන්) සුවපත් කළා ය.

v. මව්වරු ................................ (දරුවන් / දරුවෝ) සුරතල් කළෝ ය.

(ලකුණු 05 )

02. පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.

i. අඩ පාලා -

ii. බුරුල් -

iii. තනන්නේ -

iv. ඩැහැගත්තා -

v. කොට්ට වෙලා -

(ලකුණු 05 )

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය යටින් ඉරක් අඳින්න.

i. ආකර්ෂනීය , ආකර්ෂණීය, ආකර්සනීය

ii. පිළිබඳව, පිලිබඳව, පිළිබදව

iii. දර්ෂණය, දර්ෂනය, දර්ශනය

iv. හෘදයාංගම, හෘර්දයාංගම, හෘදයංගම

v. පුස්තකාලය, පුස්ථකාලය, පුස්තකාළය

(ලකුණු 05 )

04. පහත පදවලට විරුද්ධ පද ලියන්න.

i. ප්‍රීතිය

ii. උණුසුම

iii. නිශ්චල

iv. දිළිඳු

v. යහපත්

(ලකුණු 05 )

05. මුලින් දී ඇති පිල්ලම් යොදා වචන දෙක බැගින් ලියන්න.

i. ගයනුකිත්තත්ත - ...................................... / ...............................................

ii. ගැටය සහිත ඇලපිල්ල - ...................................... / ...............................................

iii. කොම්බුව - ...................................... / ...............................................

iv. දීරඝ පා පිල්ල - ...................................... / ...............................................

v. දීර්ඝ ඉස්පිල්ල - ...................................... / ...............................................

(ලකුණු 10)

06. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

i. වතුර යන්නට සමාන පදය වන්නේ,

i. අබ ii. තෙත iii. අඹ iv.සඳ

ii. මධ්‍යම පුරුෂ ඒක වචනය වන්නේ මින් කුමක් ද?

i. තොපි ii. තෝ iii.නුඹලා iv. මම

iii. අලියා යන පදයේ ස්ත්‍රී ලිංග පදය කුමක් ද?

i. ඇතින්න ii. අලිදෙන iii. කෙනෙර iv. ඇතා

iv. “ඔහු”යන්න අයත් වන පුරුෂය වන්නේ,

i. උත්තම පුරුෂ ii. මධ්‍යම පුරුෂ iii. ප්‍රථම පුරුෂ iv. බහු පුරුෂ

v. අතීත කාල ක්‍රියාපදයක් නොවන්නේ,

i. කළේ ය. ii. පැසසුවේ ය. iii. ගත්තේය. iv. කරති.

(ලකුණු 05)

07. පහත වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ආඛ්‍යාත පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. කුරුල්ලෝ අහසේ පියාසර ................................ (කළේ ය. / කරති.)

ii. තාපස තුමා දානයට .............................. (වැඩියා ය. / වැඩියේ ය.)

iii. අම්මා පෙහෙවස් සමාදන් .......................................... (වූහ. / වූවාය.)

iv. බල්ලා රාත්‍රියේ .......................................... (බුරති. / බිරුවේය.)

v. සුළඟට ගස් .................................................. (සෙලවෙයි. / සෙලවෙති.)

(ලකුණු 04)

## ii කොටස

*ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පන්ති කාමරයේදී ඔබ විසින් සකස් කරන ලද පොත් පිංච ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඔබ සකස් කළ පොත් පිංචට යෙදූ නම කුමක් ද?

ii. ඔබ පොත් පිංච සැකසීමට තොරතුරු සොයා ගත් ආකාර 2 ක් ලියන්න.

iii. ඔබේපොත් පිංචේ ඇතුළත් කවි ලියූ රචකයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

iv. පොත් පිංච සකස් කිරීමේදී ඔබට ගුරුතුමිය දුන් උපදෙස් 2 ක් ලියන්න.

v. පොත් පිංච සැකසීමේදී ඔබ මුහුණු දුන් ගැටලු 2 ක් ලියන්න.

(ලකුණු2x5=10)

02. පහත දැක්වෙන මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න.

i. මා කියවූ හොඳම පොත

ii. මම හොඳ ළමයෙක් වෙමි.

iii. ශ්‍රී ලංකාවේ වැද්දෝ

iv. මට පියාපත් ලැබුනොත්

v. මුහුදු වෙරළක අසිරිය

(ලකුණු 20)

03. ඔබේ නිවසේ පැවැත්වෙන දානමය පුණ්‍ය කර්මයකට සහභාගි වන ලෙස දන්වමින් හොඳම මිතුරාට/ මිතුරියට යවන ලිපිය ලියන්න.

නැතහොත්,

ඔබේ අත්අම්මාගේ හෝ සීයාගේ 70 වන උපන් දිනයට සුභ පැතීමට සුභ පැතුම්පතක් පිළියෙල කරන්න.

(ලකුණු 10)

04. උදැල්ල හා කැත්ත කරේ තබාලා
සැහැල්ලුවෙන් බෝම දෙපා නගාලා
දැකුම් කලුයිදැන් ගොවියා ගමන් ගත්
උදය සිරි ගේ සිරි ඉන් වැඩි වේ

i. මෙම කවියෙන් කියවෙන්නේ කවුරුන් ගැනද?

ii.”දැකුම් කලුයි” යන පදයේ අර්ථය කුමක් ද?

iii. මෙම කවිය ඇතුළත්පාඩමේ නම කුමක් ද?

iv. මෙම කවියෙහි රචකයා කවරෙක් ද?

v. මෙම කවියෙන් දවසේ කුමන කාලයක් ගැන කියවේ ද?

(ලකුණු 10)

05. පහත පාඨ කියවා අසා ඇති ප්‍රශ්න  වලට පිළිතුරු සපයන්න.

''හොඳ හැටි තදින් ඩැහැ ගන්ට ඕනෑ''

i.  මෙසේ කීවේ කවුද?

ii. මෙසේ කීවේ කාට ද?

iii. ඩැහැ ගන්ට ඕනෑ කුමක් ද?

iv. මෙම කවියෙහි රචකයා කවරෙක් ද?

v. එහි කතුවරයා කවරෙක් ද?

(ආ) ''මේක ඒකකටකටත් මදිනේ''

i.  මෙසේ කීවේ කවු ද?

ii. මෙසේ කීවේ කාට ද?

iii. මදි වූයේ  මොනවා ද?

iv. මෙම පාඨය ඇතුළත් පාඩම කුමක් ද?

v. මෙම පාඩමෙන් කියවෙන්නෙ කවුරුන් ගැනද?

(ලකුණු10)